Diploma Programme
Programme du diplôme
Programa del Diploma

# Sinhalese A: literature – Standard level – Paper 2
# Singhalais A : littérature – Niveau moyen – Épreuve 2
# Singalés A: literatura – Nivel medio – Prueba 2

Thursday 11 May 2017 (morning)
Jeudi 11 mai 2017 (matin)
Jueves 11 de mayo de 2017 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

## Instructions to candidates

- Do not open this examination paper until instructed to do so.
- Answer one essay question only. You must base your answer on at least two of the part 3 works you have studied and compare and contrast these works in response to the question. Answers which are not based on a discussion of at least two part 3 works will not score high marks.
- You are not permitted to bring copies of the works you have studied into the examination room.
- The maximum mark for this examination paper is **[25 marks]**.

## Instructions destinées aux candidats

- N’ouvrez pas cette épreuve avant d’y être autorisé(e).
- Traitez un seul sujet de composition. En basant votre réponse sur au moins deux des œuvres de la troisième partie que vous avez étudiées, vous devez comparer et opposer ces œuvres dans le cadre du sujet. Les réponses qui ne sont pas basées sur au moins deux des œuvres de la troisième partie n’obtiendront pas une note élevée.
- Vous n’êtes pas autorisé(e) à apporter des exemplaires des œuvres que vous avez étudiées dans la salle d’examen.
- Le nombre maximum de points pour cette épreuve d’examen est de **[25 points]**.

## Instrucciones para los alumnos

- No abra esta prueba hasta que se lo autoricen.
- Conteste una sola pregunta de redacción. Base su respuesta en al menos dos de las obras estudiadas de la parte 3, comparándolas y contrastándolas en relación con la pregunta. Las respuestas que no se basen en al menos dos obras de la parte 3 no recibirán una puntuación alta.
- No está permitido traer copias de las obras estudiadas a la sala de examen.
- La puntuación máxima para esta prueba de examen es **[25 puntos]**.

2217 – 0180



© International Baccalaureate Organization 2017

International Baccalaureate
Baccalauréat International
Bachillerato Internacional

පහත සඳහන් ප්‍රශ්න අතුරින් **එක් ප්‍රශ්නයකට** පමණක් පිළිතුරු සපයන්න. 3 වන කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් **යටත් පිරිසෙයින් දෙකක් වත්** ඔබේ පිළිතුරට පදනම් විය යුතු වන අතර ප්‍රශ්නයට අදාළ වන සේ එම කෘති **සන්සන්දනාත්මක ව විමර්ශනය කළ යුතුය**. 3 වන කොටසෙන් යටත් පිරිසෙයින් ග්‍රන්ථ දෙකක් පිළිබඳ සාකච්ඡාවක් පදනම් කොට ගෙන **නොමැති** පිළිතුරුවලට ඉහළ ලකුණු ගණනක් නොලැබෙනු ඇත.

**සම්භාව්‍ය සාහිත්‍යය**

**1.** ඔබ හදාරා ඇති කෘති දෙකක්වත් ඇසුරින් සම්භාව්‍ය ලේඛකයන් ජන ජීවිතය හා සමාජය හෙළිදරව් කිරීමට දැරූ ප්‍රයත්නය විභාග කරන්න.

**2.** සම්භාව්‍ය ලේඛකයන් විසින් භාවිත කර ඇති ආඛ්‍යාන විධික්‍රම ඔබ හදාරා ඇති කෘති දෙකක්වත් ඇසුරින් විභාග කරන්න.

**3.** සම්භාව්‍ය ගද්‍ය ලේඛකයන් දහම් පණිවිඩ ඉදිරිපත් කර ඇති ආකාරය සහ ඒ සඳහා යොදාගත් සාහිත්‍ය උපක්‍රම ඔබ හදාරා ඇති කෘති දෙකක්වත් ඇසුරින් විමසන්න.

**නාට්‍යය**

**4.** ගැඹුරු පණිවිඩයක් ලබාදීම සඳහා හාස්‍යය යොදාගත හැකි ආකාරය ඔබ නරඹා ඇති හෝ හදාරා ඇති නාට්‍ය දෙකක්වත් ඇසුරින් විශ්ලේෂණය කරන්න.

**5.** ප්‍රේක්ෂකයන්ගේ හැඟීම් හා අදහස්වලට බලපෑමක් ඇති කිරීම සඳහා නාට්‍ය රචකයන් යොදා ගන්නා උපක්‍රම ඔබ නරඹා ඇති හෝ හදාරා ඇති නාට්‍ය දෙකක්වත් ඇසුරින් සාකච්ඡා කරන්න.

**6.** "නාට්‍යමය උත්ප්‍රාසය නාට්‍ය කලාවේ බොහෝ විට වැදගත් වන සම්මුතියකි." ඔබ හදාරා ඇති හෝ නරඹා ඇති නාට්‍ය දෙකක්වත් ඇසුරින් මේ අදහස සාකච්ඡා කරන්න.

**නවකථාව**

**7.** නවකථාකරුවා රූපක හා සංකේත භාවිත කරන ආකාරය කෘතියට සමස්ත වශයෙන් බලපාන ආකාරය ඔබ හදාරා ඇති නවකථා දෙකක්වත් ඇසුරින් විමසන්න.

**8.** ඔබ හදාරා ඇති නවකථා දෙකකවත් ආරම්භය සසඳමින් පාඨක අවධානය කෘතියට ලබා ගන්නා ආකාරය පිළිබඳ විවරණයක් කරන්න.

**9.** කථා වස්තුව ගොඩනැංවීමට සහ ආඛ්‍යානය ඌනපූරණය කිරීමට සංවාද කොතෙක් දුරට දායක වන්නේ ද යන්න ඔබ හදාරා ඇති කෘති දෙකක්වත් ඇසුරින් සංසන්දනය කරන්න.

**නූතන පද්‍ය**

**10.** පෞද්ගලික අත්දැකීම් කවියට සම්බන්ධ කිරීමට යොදා ගන්නා උපක්‍රම ඔබ හදාරා ඇති කවීන් දෙදෙනකුවත් ඇසුරින් සන්සන්දනය කරන්න.

**11.** රිද්මය සහිත හෝ රිද්මය රහිත කාව්‍ය නිර්මාණවල ප්‍රතිඵල ඔබ හදාරා ඇති කවීන් දෙදෙනකුවත් ඇසුරින් විශ්ලේෂණය කරන්න.

**12.** විවිධාකාර පවුල් සහ සමාජ සම්බන්ධතා ගවේෂණය කිරීම කවීන් සිදු කර ඇත්තේ කෙසේද යන්න ඔබ හදාරා ඇති කාව්‍ය නිර්මාණ දෙකක්වත් ඇසුරින් සාකච්ඡා කරන්න.

**කෙටිකතාව**

**13.** "කෙටිකතාවක බොහෝ විට විවෘත හෝ අනපේක්ෂිත අවසානයක් ඇත." ඔබ හදාරා ඇති කෙටිකතාකරුවන් දෙදෙනකුගේවත් කතා අවසන් කරන ආකාරය දක්වා කථාව කෙරෙහි එහි බලපෑම සාකච්ඡා කරන්න.

**14.** සංකල්ප රූප භාවිතය හා එහි ප්‍රතිඵල ඔබ හදාරා ඇති කෙටිකතාකරුවන් දෙදෙනකුගේවත් කෘති ඇසුරින් සන්සන්දනය කරන්න.

**15.** කෙටිකතාකරුවන් ඔවුන්ගේ කෘතිවල ග්‍රාමීය හෝ නාගරික පරිසරය යොදා ගෙන ඇති ආකාරය ඔබ හදාරා ඇති කතුවරුන් දෙදෙනකුගේවත් කෘති ඇසුරින් සසඳන්න.